| | | |
|---|---|---|
| **11 ශ්‍රේණිය** | **වලස්මුල්ල අධ්‍යාපන කලාපය.**<br>**ප්‍රතිඵල ප්‍රවර්ධන වැඩසටහන - 2018**<br>**භූගෝල විද්‍යාව I** | **කාලය පැය 1 යි වි. 30 යි.** |

නම -...................................................................................................................................

★ **අංක 1 සිට 15 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1. පෘථිවිය මතු පිට ඇති සමස්ථ ජලස්කන්දයේ ප්‍රමාණය ඝණ කිලෝමීටර් .................................. පමණ වන බව ගණනය කර ඇත.
(මිලියන 1386/ මිලියන 2586/මිලියන 1536)

2. උන්නතාංශය ඉහළ යාමත් සමඟ උෂ්ණත්වයද ක්‍රමයෙන් ඉහළ යාම .................................. හි විශේෂ ලක්ෂණයකි.
(පරිවර්ථී ගෝලය/ අපරවර්ථී ගෝලය/මොසෝගෝලය)

3. පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන්වන සීමාව .................................. නමින් හැඳින් වේ.
(මොහොරෝ විසින් අසන්තතිය/ ගුටෙන් බර්ග් අසන්තතිය/ ඉහළ ප්‍රවාරණය)

4. මුහුදු මට්ටමේ සිට ඉහළම උසින් .................................. සානුව පිහිටා ඇත.
(පාමීර්/ ඩෙකෑන්/ ටිබෙට්)

5. නයිල් ගඟ .................................. ආරම්භ වේ.
(විලකින්/ උමගකින්/ ගලෑසියර ජලයෙන්)

6. ලෝකයේ පැරණිම සිතියම නිර්මාණය කරනු ලැබුවේ .................................. ශිෂ්ටාචාර වැසියන් විසිනි.
(නයිල් නිම්න/ මෙසපොතේමියානු / ඉන්දු නිම්න)

7. පොළවේ තැන්පත් වී ඇති ස්වභාවය අනුව .................................. මිනිරන් ඉතා පිරිසිදු කුට්ටි වශයෙන් පවතී.
(ධමනි/ ක්ෂුද්‍ර ස්ඵටික/ පාෂාණවල විසිරී පවතින)

8. නිවර්ථන කලාපයේ සහ ඇමේෂන් ද්‍රෝණිය ආශ්‍රිත කලාපයේ ප්‍රධාන වශයෙන්ම .................................. වනාන්තර ව්‍යාප්තව ඇත.
(නිවර්ථන වර්ෂා/ සෞම්‍ය කලාපීය/ කේතුධර)

9. .................................. පස ශ්‍රී ලංකාවේ වියළි කලාපයට සීමා වන පස් වර්ගයකි.
(රතු දුඹුරු/ දියළුම/ රතු කහ ලැටසෝල්)

10. ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුවද ගංගා නිම්න .................................. කින් පෝෂණය වේ.
(108/203/103)

11. මෑතක දී හම්බන්තොට බරුතකන්දේ .................................. බලාගාරයක් පිහිටුවා ඇත.
(සූර්ය/තාප/ගල් අඟුරු)

12. වර්ථමානය වන විට ලෝක ජන සංඛ්‍යාව .................................. ඉක්මවා ඇත.
(බිලියන 17/මිලියන 80/බිලියන 7)

13. එක් සුවිශේෂී කරුණක් දැක්වීම සඳහා පමණක් .................................. සිතියම් නිර්මාණය කර ඇත.
(තේමා/ භූ ලක්ෂණ/ සංස්කෘතික)

14. සිතියමක පර්යන්ත තොරතුරු දැක්වීමේ දී සිතියමෙහි නම වට තීරුවේ .................................. කොටසෙහි සඳහන් වේ.
(ඉහළ/පහළ/මුහුණත)

15. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාතිකය .................................. කි.
(0.7%/ 1.33%/ 0.35%)

★ **අංක 16 සිට 25 දක්වා දී ඇති ප්‍රකාශ කියවා බලා ඒවා නිවැරදිනම් " නි" යන්න වටා ද වැරදිනම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

16. ලෝකයේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ ඇරිස්ටෝටල් විසින් පෘථිවිය පුළුල් දේශගුණ කලාප තුනකට බෙදා දැක්වීම.
නි / වැ

17. ආසියාවේ වී වගා කරන ප්‍රධාන ප්‍රදේශ ලෙස තායිලන්තය, චීනය ආදී රටවල් වැදගත් වේ.
නි / වැ

18. උස්බිම් ප්‍රදේශයක සිට පහත් බිම් ප්‍රදේශයට නෙරා හෝ විහි දී ගිය සමෝච්ච රේඛා සහිත බිම් කොටස නිම්නය නමින් හැඳින් වේ.
නි / වැ

19. ශ්‍රී ලංකාවේ අඩු වියදම් බල ශක්ති උත්පාදනය කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා සුනිත්‍ය විදුලිබල ශක්ති අධිකාරිය පිහිටුවා ඇත.
නි / වැ

20. ක්‍රි.ව. 1750 පමණ කාල පරිච්ඡේදයේ සිට මරණ අනුපාතිකය වැඩිවීමත් උපත් අනුපාතිකය අඩුවීමත් නිසා ජන සංඛ්‍යාවේ ශීඝ්‍ර අඩුවීම ජන සංඛ්‍යා ස්පෝටනය ලෙස හැඳින්වේ.
නි / වැ

21. ආක්ටික් සහ ඇන්ටාක්ටික් ප්‍රදේශ ලෝකයේ ජන හීන ප්‍රදේශ වලට අයත් වේ.
නි / වැ

22. ශ්‍රී ලංකාවේ මුල්ම විධිමත් ජන සංගණනය ක්‍රි.ව. 1971 වර්ෂයේ දී පවත්වා ඇත.
නි / වැ

23. ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රභව අතරින් ජෛව ස්කන්ධ වැඩි වශයෙන්ම භාවිතා වේ.
නි / වැ

24. රතු මුහුද හා චීන මුහුද සම්පූර්ණයෙන්ම ගොඩබිමින් වට වූ මුහුදු වේ.
නි / වැ

25. ශ්‍රී ලංකාවේ හම්බන්තොට, මාතලේ, කුරුණෑගල යන දිස්ත්‍රික්ක තෙත් කලාපයට අයත් වේ.
නි / වැ

★ **අංක 26 - 30 දක්වා ප්‍රශ්න වල "අ" සහ "ආ" තීරු සම්බන්ධතාව අනුව ගලපා නිවැරදි පිළිතුරට හිමි අංකය හිස් ඉරමත ලියන්න.**

26.

| | අ | | ආ | | |
|---|---|---|---|---|---|
| 1. | වී වගාව | A | ලැටරයිට් රතු පස | i. | BAD |
| 2. | තිරිඟු වගාව | B | දියළු පස | ii. | ABC |
| 3. | තේ වගාව | C | කබොක් පස | iii. | CDA |
| | | D | චර්නෝසම් පස | iv | BCA |

27.

| | අ | | ආ | | |
|---|---|---|---|---|---|
| 1. | කරදිය මසුන් බෝ කරන මධ්‍යස්ථාන | A | මුරුතවෙල | i. | BAD |
| 2. | මිරිදිය මසුන් බෝ කරන මධ්‍යස්ථාන | B | ගාල්ල | ii. | DBA |
| 3. | අභ්‍යාස මධ්‍යස්ථාන | C | හලාවත පම්බල | iii. | CAB |
| | | D | හම්බන්තොට | iv | ABC |

28.

| | අ | | ආ | | |
|---|---|---|---|---|---|
| 1. | තාප විදුලි බලාගාරය | A | හම්බන්තොට | i. | ACB |
| 2. | සුළං විදුලි බලාගාරය | B | කොලොන්නාව | ii. | DAB |
| 3. | ජල විදුලි බල මධ්‍යස්ථානය | C | විමල සුරේන්ද්‍ර | iii. | BDA |
| | | D | නොරොච්චෝලෙ | iv | DAC |

29.

| | අ | | ආ | | |
|---|---|---|---|---|---|
| 1. | ලෝකයේ ජනාධික කලාප | A | උතුරු ඇමරිකාවේ නැගෙනහිර ප්‍රදේශ | i. | BCA |
| 2. | ද්විතියික ජන සංකේන්ද්‍රණ | B | අප්‍රිකා මහද්වීපයේ සහරා ප්‍රදේශය | ii. | CAB |
| 3. | ලෝකයේ ජන හීන ප්‍රදේශ | C | නැගෙනහිර ආසියානු ප්‍රදේශය | iii. | DAB |
| | | D | අරාබි ප්‍රදේශය | iv | BDC |

30.

| | අ | | ආ | |
|---|---|---|---|---|
| 1. | භූ විද්‍යාත්මක උපද්‍රව | A සුනාමි | i. | ACD |
| 2. | දේශගුණික උපද්‍රව | B ඉඩෝරය | ii. | DAC |
| 3. | ජීව විද්‍යාත්මක උපද්‍රව | C ජල ගැලීම් | iii. | CDA |
| | | D ලැව් ගිනි | iv | ABD |

★ **අංක 31 - 35 දක්වා ප්‍රශ්නවල හිස්තැන් වලට නිවැරදි පිළිතුරු යොදා සම්පූර්ණ කරන්න.**

31. වර්ග කිලෝමීටරයක් තුළ ජීවත්වන පුද්ගලයින් සංඛ්‍යාව ............................................ ලෙස හඳුන්වයි.

32. රටවල සංවර්ධන මට්ටම හඳුනා ගැනීම සඳහා යොදා ගන්නා මිණුම් අතර භෞතික ජීවන තත්ත්ව දර්ශකය ............................................ මිණුමකි.

33. භූගෝල විද්‍යාත්මක ප්‍රස්තාර නිර්මාණය කිරීම සඳහා දෙන ලද සංඛ්‍යා ලේඛණයේ මුළු විචල්‍ය වටිනාකම 360 ක්සේ සලකා එක් එක් විචල්‍යවල වටිනාකම ගණනය කර අඳිනු ලබන ප්‍රස්තාර වර්ගය ...................... ........................ ප්‍රස්ථාර නම් වේ.

34. ලෝකයේ යකඩ හා වානේ නිශ්පාදන මධ්‍යස්ථාන ලෙස ........................................ පිහිටා ඇති බීජිං ප්‍රදේශය වැදගත් වේ.

35. පැන්සල්, කූරු, පොලිෂ් වර්ග, ආදිය නිශ්පාදනය කිරීම සඳහා ........................................ ඛනිජය යොදා ගනී.

★ **පහත සඳහන් රූප සටහන ඇසුරින් 36 - 45 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




පරිමාණය 1 : 50 000

36. රූප සටහනෙහි R අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශයේ ........................................ වගාව ව්‍යාප්තව පවතී.

37. රූප සටහනෙහි දැක්වෙන කොත් කන්දෙහි උපරිම උස මීටර් ........................................ කි.

38. රූප සටහනෙහි E - F රේඛාවෙන් දැක්වෙන්නේ ........................................ ය.

39. රූප සටහනෙහි D අක්ෂරයෙන් දැක්වෙන්නේ ........................................ කි.

40. G අක්ෂරයෙන් දැක්වෙන්නේ ගංගාවේ ........................................ ලක්ෂණයයි.

41. H අක්ෂරයෙන් දැක්වෙන කොටු සහිත ප්‍රදේශයේ සැබෑ භූමියේ වර්ගඵලය දළ වශයෙන් වර්ග කිලෝ මීටර් ............................................ කි.

42. රූප සටහනෙහි K - L රේඛාවෙන් ........................................................ භූ ලක්ෂණය පෙන්වයි.

43. රූප සටහනෙහි දැක්වෙන ප්‍රදේශයේ වැඩිම උස මීටර් ........................................ කි.

44. B ශ්‍රේණියේ මහා මාර්ගය දෙපස ........................................ ජනාවාස පිහිටා ඇත.

45. ප්‍රධාන ගංගාවට එකතුවන අතු ගංගාවෙහි A ස්ථානයේ සිට B ස්ථානයට ඇති සැබෑ දුර කි.මී. ................ ........................................ කි.

★ **ප්‍රශ්න අංක 46 - 55 දක්වා දී ඇති එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා ඊට හිමි අංකය තිත් ඉරමත ලියන්න.**

46. පෘථිවි අභ්‍යන්තරයේ ඇති මැග්මා සිසිල් වීමෙන් සෑදෙන පාෂාණ වර්ගය වන්නේ

i. ආග්නේය ii. අවසාදිත iii. විපරීත iv. ඩොලමයිට් (...........)

47. කේතුධර වනාන්තරවල දක්නට ලැබෙන ශාඛ වර්ගයකි.

i. පයින් ii. ස්පෘස් iii. මැහෝගනී iv. හඳුන් (...........)

48. සුනාමි තරංග ඇතිවීම කෙරෙහි බලපාන ප්‍රබල සාධකය වන්නේ

i. සාගර පතුල්වල නායයෑම් ii. සාගර මතට උල්කාපාත කඩා වැටීම.
iii. හිම කඳුවල කොටස් සාගරයට කඩා වැටීම iv. සාගර පතුල්වල සිදුවන භූමිකම්පා (...........)

48. ශ්‍රී ලංකාවේ බහුලව සිදුවන අපද්‍රව නම්

i. නියගය ii. සුනාමි iii. නායයෑම් iv ජල ගැලීම් (...........)

49. 1:50000 භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා අන්තරය

i. 20 m ii. 100 m iii. 200 m iv.40 m (...........)

50. ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් පිරිපහදු කිරීමේ කර්මාන්ත ශාලාව පිහිටා ඇත්තේ

i. බොරලැස්ගමුව ii. මීටියාගොඩ iii. සපුගස්කන්ද iv. වව්නියාව (...........)

51. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විදේශ විනිමය ඉපයීමේදී වැඩි දායකත්වයක් සපයන්නේ

i. කෘෂි කාර්මික අපනයන ii. කාර්මික අපනයන iii. ඛනිජ අපනයන
iv. වෙනත් අපනයන (...........)

52. ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි සකසා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම් 92 න් එක් සිතියමකින් නිරූපිත භූමියේ විශාලත්වය වර්ග කිලෝමීටර්

i. 25 කි. ii. 40 කි. iii. 100 කි. iv. 1000කි.

53. ක්‍රි.ව.1890 දී පමණ බ්‍රිතාන්‍ය ජාතික හෙන්රි වික්හෑම් විසින් ගම්පහ හෙනරත්ගොඩ උද්‍යානයේ දී රෝපනය කොට හඳුන්වා දුන් වගාව නම්

i. තේ ii. කෝපි iii. කොකෝවා iv. රබර් (...........)

54. ආසියාවේ වී වගා කරන ප්‍රදේශකි.

i. මැඩගස්කරය ii. ඉතාලියේ පෝ ගංගා නිම්නය
ii. මරේඩාලිං ගංගා නිම්නය iii. තායිලන්තය (...........)

55. පරිසරය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය

i. මිහිකත සමුළුවයි ii. සාර්ක් සමුළුවයි
iii. වර්ල්ඩ් එච් ජාත්‍යන්තර පදනමයි iv ඔපෙක් සංවිධානය (...........)

| | |
|---|---|
| **II ශ්‍රේණිය** | **වලස්මුල්ල අධ්‍යාපන කලාපය.**<br>**ප්‍රතිඵල ප්‍රවර්ධන වැඩසටහන - 2018**<br>**භූගෝල විද්‍යාව II** |

නම -.......................................................................................................................

**I කොටස**

1. අ. **ඔබ වෙත සපයා ඇති භූ ලක්ෂණ සිතියම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**අනුරාධපුරය සිතියම ඇසුරින්**

1. උතුරේ සිට දකුණට දිවෙන ප්‍රධාන මාර්ගයේ දිග කොපමනද?
2. ප්‍රදේශයේ ව්‍යාප්ත වී තිබෙන්නේ ..........................................කි. (ජල සම්පාදනය / ජල වහනය)
3. මෙම ප්‍රදේශයේ වැව් රාශියක් ඉදිකිරීමට හේතුව කුමක් ද?
4. ප්‍රදේශයේ ප්‍රවාහන මාර්ගවලදී බහුලවම දක්නට ලැබෙන මාර්ග නම් කරන්න.
5. සිතියම් ගත ප්‍රදේශයේ සඳහන්වන අක්ෂාංශ හා දේශාංශ අගයයන් දෙකක් වෙන වෙනම නම් කරන්න.
6. සිතියම් ගත ප්‍රදේශයේ දක්නට ලැබෙන පරිපාලන මායිම කුමක් ද?
7. ප්‍රධාන මාර්ගය අයත්වන මාර්ග පන්තිය නම් කරන්න.
8. ප්‍රදේශයේ බහුලවම දක්නට ලැබෙන ආගමික සිද්ධස්ථාන මොනවාද?
9. ප්‍රදේශයේ භූ විෂමතාවය අනුව සමෝච්ච රේඛා මත සඳහන් වූ උස කොපමන ද?
10. සිතියමෙහි නිල්පාටින් දැක්වෙන සිරස් හා තිරස් රේඛා මොනවාද? සිතියමේ උතුරු ප්‍රදේශයේ ඇතුන්ගම ආසන්නයේ දී නිල්පාට රේඛා එකිනෙක එකතු වී යන ස්ථානයේ ජාතික (මෙට්‍රික් ) ඛණ්ඩාංක මොනවාද?

**මාතර සිතියම ඇසුරින්**

1. සිතියමෙහි E 01 නමින් දැක්වෙන මාර්ග වර්ගය කුමක් ද?
2. ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන්ම දක්නට ලැබෙන වෙරළ භූ රූප ලක්ෂණය කුමක් ද?
3. සිතියම්ගත ප්‍රදේශයේ දැක්වෙන වැඩිම සම ගැඹුරු රේඛා අගය කොපමනද?
4. සිතියම්ගත ප්‍රදේශයේ දැක්වෙන දුම්රිය මාර්ග වර්ගය කුමක් ද?
5. + ලෙස දැක්වෙන සලකුණ කුමක් ද? එහි භූ ගෝලීය ඛණ්ඩාංක මොනවාද?
6. මුහුද ආසන්නයේ දී පොල්වත්ත ගංගාවෙහි ඇති ලක්ෂණය කුමක්ද?
7. බස්නාහිර පාදයේ ඉමදුව ප්‍රදේශයේ දැක්වෙන පරිපාලන මායිම කුමක් ද?
8. සිතියමෙහි සඳහන් පැළෑක දකුණු ප්‍රදේශයේ සිට බස්නාහිර දෙසට විහිදෙන වෙරළ භූ රූප ලක්ෂණය කුමක්ද?
9. ප්‍රදේශයේ දක්නට ලැබෙන වගාවන් තුනක් නම් කරන්න.
10. සිතියමේ නිරිත කොටසේ තිබෙන රාස්සමුනේ තුඩුවේ සිට පෙම්උයන තුඩුව දක්වා දිග කොපමනද?
11. වැලිගම බොක්ක ප්‍රදේශයේ වර්ගඵලය කොපමන ද?

**හපුතලේ සිතියම ඇසුරින්**

1. සතියමේ ගිණිකොන ප්‍රදේශයේ රත්නපුර හා මොණරාගල දිස්ත්‍රික්ක අතර පිහිටි ගංගාව දිගේ විහිදෙන පරිපාලන මායිම කුක් ද?
2. ප්‍රදේශයේ සමස්ථ ජලසැපයුම සිදුවන්නේ.................................... මගිනි. (ජලවහනය, ජල සම්පදනය)
3. වැලිඔය ගංගාව නැගෙනහිර ප්‍රදේශය හරහා ගලාගෙන යද්දී ගංගාවෙහි දක්නට ලැබෙන ලක්ෂණය කුමක් ද?
4. ප්‍රදේශයේ දැක්වෙන පරිදි ඌව පලාතට අයත් දිස්ත්‍රික්ක දෙකද සබරගමු පළාතට අයත් දිස්ත්‍රික්ද නම් කරන්න.
5. ප්‍රදේශයේ දැක්වෙනවැඩම උස කොපමනද? වැඩිම උස පෙන්වන සංකේතය හඳුන්වන නම කුමක් ද?
6. සිතියමේ බොහෝ ප්‍රදේශවල දක්නට ලැබෙන භූමි පරිභෝගය කුමක් ද?
7. හල්දුම්මුල්ල නම් ප්‍රදේශයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණය කුමක් ද?
8. සිතියමේ ඊසාන කොටසෙහි දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණය කුමක් ද?
9. සිතියමේ ගිණිකොණ කෙලවර පිහිටි කළු පැහැති තිත් සහිත සංකේතයෙන් පෙන්වන්නේ කුමක් ද?
10. සිතියමේ උතුරු හා බස්නාහිර ප්‍රදේශ වල පවතින පාරිසරික තත්වය සම්බන්දයෙන් කරුණු 2 ක් ලියන්න.

**II කොටස**

1. (ආ) සපයා ඇති ලෝක සිතියමෙහි සඳහන් ලක්ෂණ වලට අදාල අක්ෂර හෝ අංක අසා ඇති ප්‍රශ්නවල ඉදිරියෙන් ලියන්න.

i. ABCDE ඇසුරින්

චීනය .......................
ජපානය .....................
අර්ජන්ටිනාව .............
ජාවා දූපත ................
මැඩගස්කරය ............

ii. FGHIJ ඇසුරින්

නයිල් ගඟ .....................
වොල්ගා ගඟ ...................
ඇමර්සන් ගඟ ..................
වික්ටෝරියා විල ...............
පංච මහා විල් ...................

iii. KLMNO ඇසුරින්

යූරල් කඳු ..............................
ඇට්ලස් කඳු ...........................
රොකී කඳු වැටිය .....................
නල්ලබාර් තැන්න .....................
මහාසයිබීරියානු තැන්න............

iv. 1, 2, 3, 4, 5 ඇසුරින්

ක්ලිමන්ජාරෝ ගිනි කන්ද ...............................
විසුවියස් ගිනි කන්ද.......................................
හෙක්ලා ගිනි කන්ද.........................................
හරිකේන් සුළි සුළං කළාපය...........................
සයික්ලෝන් සුළි සුළං කලාපය .......................

v. 6, 7, 8, 9, 10 ඇසුරින්

ඇමරිකන් එක්සත් ජනපදය .....................
බ්‍රසීලය ...................................................
කැස්පියන් මුහුද ......................................
රතු මුහුද ..................................................
බෝල්ටික් මුහුද .......................................




(ඉ) සපයා ඇති ලංකා සිතියමෙහි සඳහන් ලක්ෂණවලට අදාල අක්ෂර හෝ අංක ඉදිරියෙන් ලියන්න.

i. ABCDE ඇසුරින්

මහඉලුප්පල්ලම වී පර්යේෂන ආයතනය.....................
තලව කැලේ තේ පර්යේෂණ ආයතනය.....................
ලුණුවිල පොල් පර්යේෂණ ආයතනය.........................
අගල වත්ත රබර් පර්යේෂණ ආයතනය.......................
මාතලේ සුළු අපනයන භෝග පර්යේෂණ ආයතනය .............

ii. GHI ඇසුරින්

පදවිය මසුන් බෝකරන මධ්‍යස්ථානය...........
කිරින්ද මසුන් ගොඩබාන මධ්‍යස්ථානය..........
දික්ඕවිට යෝජිත ධීවර වරාය .....................

iii. 1, 2, 3, 4, 5 ඇසුරින්

iv. ජලාශ හා ගංගාවල නම් සිතියමෙහි ලියන්න.

v. 6, 7, 8, 9, 10 ඇසුරින්

මීටියාගොඩ .................
අම්පාර ........................
වව්නියාව ....................
රත්තොට ....................

යාන් ඔය ....................
කලා වැව ...................
කොත්මලේ ජලාශය.......
දැදුරු ඔය...................
වළවේ ගඟ........................

යාල ස්වාභාවික රක්ෂිතය ...............
විල්පත්තු ජාතික උද්‍යානය.............
නොරොච්චෝලේතාපවිදුලිබලාගාරය.....
සමනල වැව ජල විදුලි බලාගාරය ........
පුත්තලම සුළං විදුලි බලාගාරය.............




2. i. පෘතිවි පද්ධතියේ උප පද්ධතියක් වන ජෛව ගෝලයෙහි ක්‍රියාකාරිත්වය සඳහා බලපාන සාධක දෙක නම් කරන්න. ලකුණු 02

ii. ජෛව ගෝලයෙහි සීමාවන් නම් කරන්න. ලකුණු 03

iii. a. පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්ථර තුන නම් කරන්න. ලකුණු 02

b. පෘථිවි කබොලෙහි ලක්ෂණ දෙකක් ලියන්න. ලකුණු 03

3. i. ලෝකයේ කෘෂිකාර්මික භූමි පරිභෝගයෙහි ප්‍රධානම ලක්ෂණ දෙක නම් කරන්න. ලකුණු 02

ii. වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. ලකුණු 03

iii. a. ශ්‍රී ලංකාවට වී වගාවේ ඇති වැදගත්කම පෙන්වන කරුණු 2 ක් ලියන්න. ලකුණු 02

b. ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ වී වගාව සිදුවන ආකාරය පිළිබඳ කරුණු තුනක් ලියන්න. ලකුණු 03

4. i. අතීතයේ ශ්‍රී ලංකාව කිසියම් කාර්මික දියුණුවක් ලබා තිබූ බවට සාක්ෂි ඇත. ඒ අනුව අතීතයේ පැවති කර්මාන්ත දෙකක් නම් කරන්න. ලකුණු 02

ii. ශ්‍රී ලංකාවේ මෑත කාලීනව තෝරාගත් කර්මාන්ත තුනක් සඳහන් කරන්න. ලකුණු 03

iii. a. ලෝකයේ නිෂ්පාදිත කර්මාන්ත සම්බන්ධයෙන් මතු වී තිබෙන සමාජ ආර්ථික සහ සංස්කෘතික ගැටළු දෙකක් නම් කරන්න. ලකුණු 02

b. නිෂ්පාදන කර්මාන්ත සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් මතු වී තිබෙන පාරිසරික ගැටළු පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න. ලකුණු 03

5. (ග්‍රැනයිට්, කිරිගරුඬ, ඩොලමයිට්, ගැබ්රෝ)

i. ඉහත සඳහන් පාෂාණ වර්ග වලින් ආග්නේය පාෂාණවලට නිදසුන් දෙකක් ද විපරීත පාෂාණ වලට නිදසුන් දෙකක්ද තෝරා පිළිවෙලින් ලියන්න.

ii. පස නිර්මාණයට බලපාන සාධක 3 ක් නම් කරන්න.

iii. a. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජල මූලාශ්‍ර දෙකක් නම් කරන්න. ලකුණු 02

b. ජල මූලාශ්‍ර සංරක්ෂණය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. ලකුණු 03

6. i. ලෝකයේ විවිධ වනාන්තර දක්නට ලැබුනද ප්‍රධාන වනාන්තර වර්ග තුනක් අවධානයට ලක් වී ඇත. ඉන් වනාන්තර වර්ග දෙකක් නම් කරන්න. ලකුණු 02

ii. පහත සඳහන් ප්‍රදේශවල ව්‍යාප්ත වූ ප්‍රධාන වනාන්තර වර්ගය ඉදිරියෙන් ලියන්න.

කොංගෝ ද්‍රෝණිය.......................................

ඕස්ට්‍රේලියාව...............................................

උතුරු යුරෝපය හා ආසියාවේ උතුරු කොටස .................................................... ලකුණු 03

iii. a. යාබද ශ්‍රී ලංකා සිතියමේ C D වලින් දක්වා ඇති වෘක්ෂලතා කලාප නම් කරන්න. ලකුණු 02

b. වනාන්තර හා ජීවීන් ආරක්ෂා කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර තුනක් සඳහන් කරන්න.




7. i. සංවර්ධනය යන්නට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 90 දශකයේ දී ඉදිරිපත් කළ අර්ථකථනය සරලව ලියා දක්වන්න. ලකුණු 02

ii. පහත සඳහන් සංවර්ධනය මැනීමේ මිනුම්, පැරණි (සාම්ප්‍රදායික) මිනුම් හෝ නූතන මිනුම්වලට අයත් වේ දැයි ඉදිරියෙන් ලියන්න.

1. දළ ජාතික නිෂ්පාදනයේ වර්ධන වේගය
.............................................
2. භෞතික ජීවන තත්ත්ව දර්ශකය
.......................................................
3. මානුෂ දරිද්‍රතා දර්ශකය
..........................................................

iii. a. ශ්‍රී ලංකාවේ පවතින මෑත කාලීන සංවර්ධන ව්‍යාපෘති 2 ක් නම් කරන්න.

b. ශ්‍රී ලංකාවේ පහත සඳහන් ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා ගෙන ඇති පියවරයන් එක බැගින් ඉදිරියෙන් ලියන්න.

අධ්‍යාපන ක්ෂේත්‍රය..........................................................................

සෞඛ්‍ය ක්ෂේත්‍රය..............................................................................

ප්‍රාදේශීය සංවර්ධනය (ගම) .........................................................

8. i. භූ විද්‍යාත්මක උපද්‍රවයකට හා දේශගුණික උපද්‍රවයකට නිදසුන් එක බැගින් ලියන්න. ලකුණු 02

ii. ලෝකයේ භූමිකම්පා ඇතිවන ප්‍රධාන කලාප තුනක් නම් කරන්න. ලකුණු 03

iii. a. ශ්‍රී ලංකාවේ බහුලවම සිදුවන ආපදාව නම් කොට, එය බහුලවම ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. ලකුණු 02

b. ඉහත ආපදාව අවම කර ගැනීමේ එක් ක්‍රියා මාර්ගයක් නම් කොට එය කෙටියෙන් විස්තර කරන්න. ලකුණු 03

9. i. දත්ත නිරූපනය සඳහා යොදා ගන්නා ප්‍රස්තාරයක තිබිය යුතු මූලික අංග නම් කරන්න. ලකුණු 02

ii. ඕනෑම විෂයක් අධ්‍යනය කිරීමේ දී ප්‍රස්තාර භාවිතා කිරීමෙහි වැදගත්කම ලියා දක්වන්න. ලකුණු 03

iii. a. රූප සටහනේ දැක්වෙන ප්‍රස්ථාර වර්ගය නම් කොට එහි වැඩිම ප්‍රතිශතයක් හිමිවන භෝගය නම් කරන්න.

b. පහත සඳහන් දත්තයන් නිරූපනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය ප්‍රස්තාර ක්‍රමය ඉදිරියෙන් ලියන්න.

2006 - 2011 දක්වා සංචාරක පැමිණීම ......................................

2006 - 2011 වර්ෂවල කාර්මික, කෘෂිකාර්මික හා සේවා අංශවල නිෂ්පාදිත ප්‍රමාණය ...............................................

2011 වර්ෂයේ තේ, රබර්, පොල්, කුරුඳු, ආදියේ අපනයන සංයුතිය ..................................................................

